**ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 05 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

---

කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 186.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 168.64 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 17.86 ක් හෙවත් සියයට 10 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 172.20 | 159.91 | 12.29 | 7.14 |
| මූලධන | 14.30 | 8.73 | 5.57 | 38.95 |
| **එකතුව** | **186.50** | **168.64** | **17.86** | **9.58** |

## 2.2 විගණන නිරීක්ෂණය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

### 3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.2.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 5.15 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

**කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

වාහන 01 ක් නිෂ්ක්‍රීයව පැවති අතර, වාහන 05 ක් ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2015 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.4 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (i) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 වන වගන්තිය | 2015 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| • මුදල් රෙගුලාසි 802 (3) | වාහන සම්බන්ධයෙන් ඒවා මිලට ගත් දිනය, මිල, පුරාවෘත්තය, විටින් විට කළ අලුත්වැඩියාවන්, ඒ සඳහා ගිය වියදම, නිෂ්කාර්යව පවත්නා කාලය ආදි තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 1647 (ආ) | කොමිෂන් සභාව සතු වාහනද ඒවායේ උපකරණද පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | මාස 06 කට වරක් කොමිෂන් සභාව සතු වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

එකතු කළ අගය මත බදු මුදල් ගෙවීම්වලට අදාල විස්තර ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3.5 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව පහත සඳහන් කටයුතු ඉටු කර නොතිබුණි.

(i) කොමිෂන් සභාව සතුව ප්‍රාදේශීය කාර්යාල 10 ක් සහ ජංගම කාර්යාල 03 ක් පැවති අතර එම කාර්යාල පද්ධතිය පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම.

(ii) කොමිෂන් සභාවේ නිලධාරින්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය වඩාත් ඵලදායි ආකාරයෙන් වැඩිදියුණු කිරීම.

(iii) විදේශීය සංක්‍රමනික ශ්‍රමිකයන්ගේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කිරීම.

(iv) මානව හිමිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලීය පරිගණක දත්ත පද්ධතිය සහ ප්‍රාදේශීය කාර්යාලීය පරිගණක දත්ත පද්ධතිය ඒකාබද්ධ (Link) කිරීම.

## 3.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### අක්‍රීය බැංකු ගිණුම්

කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුම් 02 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට වර්ෂයකට අධික කාලයක සිට අක්‍රියව පැවැතිණි. එම ගිණුම්වල පිළිවෙලින් රු.48,947 ක හා රු.252,953 ක වශයෙන් එකතුව රු.301,901 ක ශේෂ පැවැතුණි.

## 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කොමිෂන් සභාව විසින් විධිමත් අනුමැතියක් නොමැති චක්‍රීය අරමුදලක් මඟින් 2015 වර්ෂයේදී නිලධාරින් 16 දෙනෙකුට රු.2,835,050 ක ආපදා ණය ගෙවා තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

2006 දෙසැම්බර් 06 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (ආ) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන කිසියම් අරමුදලක් වේ නම් එම අරමුදල පවත්වා ගෙන යාමට සාධාරණ හේතු පවතී නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට හැකි වන පරිදි අදාළ හේතු දක්වමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට උපදෙස් දී තිබුණි. එසේ කටයුතු නොකර 2014 දෙසැම්බර් 26 දින ව්‍යාපෘති සඳහා ලද මුදල්වලින් බැංකු ගිණුම් 04 ක පැවති ශේෂවල එකතුව වූ රු.695,355 ක් චක්‍රීය අරමුදලට ලබා ගෙන තිබුණි.

**3.9** **කළමනාකරණ දුර්වලතා**

------------------------------

සිංහල හා දෙමළ භාෂාවලින් පොත් 53,000 ක් රු.1,979,000 ක් වැය කර මුද්‍රණය කර තිබූ අතර එම පොත් බෙදාහැරීම් පිළිබඳ තොරතුරු නිසි පරිදි පොත්වල සටහන් කර නොතිබුණි. ඉතිරිව තිබුණු පොත් 5520 ක් ආරක්ෂිත ලෙස ගබඩා කර ගැනීමේ පහසුකම් අදාළ කාර්යාලය සතුව නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.10** **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 16 | 30 | - |
| (ii) | තෘතීයික මට්ටම | 11 | - | 11 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 135 | 69 | 66 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 41 | 40 | 01 | - |
| (v) | වෙනත් | - | 36 | - | 36 |
| | **එකතුව** | **233** | **161** | **108** | **36** |

ප

හත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අතිරික්ත කාර්ය මණ්ඩලය 36 දෙනෙකු වී තිබුණත්, එම අතිරික්ත කාර්ය මණඩලය සඳහා අනුමැතියක් ලබා ගැනිම සඳහා කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර 31 දින වන විටත් අපොහොසත් වි තිබුණි.